සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# නර්තනය

12 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

## I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ගැලපෙන පිළිතුරට අදාළ අංකය තිත් ඉර මත ලියන්න**

(01) බෙන්තර ගලපාත විහාරයේ උළුවස්සේ, උඩැක්කි, බෙර, හොරණෑ, රූකම් අයත් වන්නේ,
(1) මහනුවර යුගයට (2) අනුරාධපුර යුගයට
(3) ගම්පල යුගයට (4) පොළොන්නරු යුගයට (........)

(02) හවරිය, පනාව, කැඩපත, මාල, වළලු යනාදී රංග උපකරණ යොදා ගන්නා නාට්‍ය පොළපාලිය වන්නේ,
(1) කපුයක්කාරිය (2) නානුමුරය (3) දරු නැළවිල්ල (4) පැදුරේ දූපවිල්ල (.......)

(03) ත්‍රිවිධ රත්නය මුල්කරගෙන පවත්වන ශාන්ති කර්මයයි,
(1) බලි ශාන්ති කර්මය (2) සන්නියකුම (3) රට යකුම (4) සූනියම් යාගය (........)

(04) ගවයින්ට වැළඳෙන රෝග ආදියෙන් මිදීම හා සශ්‍රීකත්වය පතා පවත්වන ශාන්ති කර්මයකි,
(1) දෙවොල් මඩු (2) කිරි මඩු (3) ගම් මඩු (4) පහන් මඩු (........)

(05) ''රත්නදීප ජන්ම භූමි ලංකා දීප විජය භූමි......'' මෙම ගීතය,
(1) තාලානුකූල චලන ගීයකි. (2) ප්‍රකාශනාත්මක චලන ගීයකි.
(3) රිද්මයානුකූල චලන ගීයකි. (4) ඉහත සියල්ලටම අයත්ය. (........)

(06) 10 හා 11 වන ගොඩ සරඹ වල සරඹ නාමයන් වන්නේ,
(1) බඹර සරඹය හා පැනීමේ සරඹය (2) බඹර සරඹය හා චන්ද්‍රිකා සරඹය
(3) අර්ධ චක්‍ර සරඹය හා බඹර සරඹය (4) අංග හාර සරඹය හා අර්ධ චක්‍ර සරඹය (........)

(07) වට්ටම් නටනු ලබන්නේ,
(1) වෘත්තාකාරවය (2) දෙපේළියටය
(3) ඕඩියටය (4) දෑත් යොදා නොගෙනය (........)

(08) උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ අවුල් හැරය වූ කලී,
(1) හිසට පළඳින්නකි. (2) පපුවට පළඳින්නකි.
(3) පයට පළඳින්නකි. (4) අතට පළඳින්නකි. (........)

(09) දෙවොල් බෙරය හා හොරණෑව අයත් වන්නේ,
(1) ආතතයට හා විතතයට (2) ආතතයට හා සුසිරයට
(3) විතතයට හා ඝණයට (4) විතතාතයට හා සුසිරයට (........)

(10) නාට්‍යමය අවස්ථා අතර අඹ විදමන හා මරා ඉපැද්දවීම අයත් වන්නේ,

(1) පහන් මඩුවට (2) දෙවොල් මඩුවට (3) කිරි මඩුවට (4) ගම් මඩුවට (........)

(11) නර්තන විෂය පාසල් විෂය මාලාවට එක් වූයේ,

(1) 1945 (2) 1943 (3) 1923 (4) 1975 (........)

(12) තිතට පෙර ගායනය ඇරඹීම,

(1) සමග්‍රහ ය. (2) විෂමග්‍රහය ය. (3) නව ග්‍රහ ය. (4) අව ග්‍රහ ය. (........)

(13) පොකුරු බෙරය හා එකැස් බෙරය ලෙස හැඳින්වෙන්නේ,

(1) තම්මැට්ටම හා රබාන
(2) උඩැක්කිය හා රබාන
(3) ගැටබෙරය හා බුම්මැඩිය
(4) දවුල හා තම්මැට්ටම (........)

(14) මේවා ගැටබෙරයේ කොටස් කිහිපයකි,

(1) සුරත් තට්ටුව, බෙර පුහුල, බෙර ශබ්දය
(2) බෙර පුහුල, කංවර කඳ, බෙර කට
(3) කැපුම් හම, වෙනිවර කැරැල්ල, සුරත් තට්ටුව
(4) කැපුම් පටිය, සුරත් තට්ටුව, බෙර කඳ (........)

(15) සැවුලා වන්නම හා නෛඅඩි වන්නම නටනු ලබන්නේ,

(1) මාත්‍රා 2 + 3 සහ 2 + 4 තිතටය.
(2) මාත්‍රා 2 + 3 සහ 3 + 4 තිතටය.
(3) මාත්‍රා 2 + 4 සහ 3 + 4 තිතටය.
(4) මාත්‍රා 2 + 4 සහ 2 + 3 තිතටය. (........)

(16) ''ජිංගත ගො ගො'' යන බෙර පදයේ අලංකාර බෙර පදය ලෙස වාදනය කළ හැක්කේ,

(1) රුංතක ජිතක
(2) ජිං කඩ තක ජිංකුකු තක
(3) ගොග් ගොග් ජිං තකට තකට
(4) ජිං තත් තත් ජිං දොං දොං (........)

(17) ඊසාන දිග භාරතයේ ප්‍රචලිත නර්තන සම්ප්‍රදාය වන්නේ,

(1) භරත (2) මණිපුරි (3) කථක් (4) කථකලී (........)

(18) හත් පද නැටීමේ දී මෙම භාණ්ඩ භාවිතා කරයි,

(1) හක් ගෙඩිය, කොතලය හ බුලත් අත
(2) කොතලය, පොල් ගෙඩිය හා බුලත් අත
(3) ඊ ගස, පොල් ගෙඩිය හා සලුව
(4) දුම්මල කබල, ඊ ගස හා පොල් පන්දම (........)

(19) කොහොඹා කංකාරියේ පුද ලබන දෙවිවරු අතරට නොගැනෙන්නේ,

(1) වීර මුණ්ඩ (2) කොහොඹා දෙවි (3) බණ්ඩාර දෙවිවරු (4) පත්තිනි දෙවි (........)

(20) ත්‍රිවිධ ලය ලෙස හඳුන්වන්නේ,

(1) විලම්භ, මධ්‍ය, දෘත
(2) තනි තිත, දෙතිත, සිව්තිත
(3) සමග්‍රහ, අවග්‍රහ, විෂම ග්‍රහ
(4) තිත, ආඝාත, කණ්ඩලම් (........)

(21) පහතරට සම්ප්‍රදායේ දක්නට ලැබෙන ප්‍රධාන ශෛලීන් දෙක වන්නේ,

(1) මාතර හා බෙන්තර
(2) බෙන්තර හා කළුතර
(3) රුහුණු හා මාතර
(4) දෙවිනුවර හා බෙන්තර (........)

The National e-learning Portal for The General Education

(22) උඩරට නර්තන සම්ප්‍රදායට අයත් වන්නම් වන්නේ,

(1) සුරපති, කිරලා, ඊරඩි (2) කුදිරඩි, කෝකිල, ගජගා

(3) සුරපති, අනිලා, ඊරඩි (4) කිරලා, ගජගා, අනිලා (........)

(23) සොකරි රඟ දක්වන්නේ,

(1) තානායම් පළ රංග භූමිය ලෙස ගෙන. (2) කමත රංග භූමිය ලෙස ගෙන.

(3) විහාර මළුව රංග භූමිය ලෙස ගෙන. (4) කරලිය රංග භූමිය ලෙස ගෙන. (........)

(24) ''තෙයියත් තෙයියත් තෙයියත් තාම් තේයි තාම් තෙයි තෙයි තත් තත් තා.....'' මෙය,

(1) හමාර පදයයි. (2) 9 වන පා සරඹයයි.

(3) කස්තිරමකි. (4) කලාසමකි. (........)

(25) උඩරට හා සබරගමු නර්තනයේ මූලික සරඹ අභ්‍යාස හඳුන්වන්නේ,

(1) පා සරඹ, ඉරට්ටි (2) ඉලංගම් සරඹ, අත් සරඹ

(3) අත් සරඹ, පා සරඹ (4) පා සරඹ, දෙඹින පද (........)

- **පහත ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.**

(26) භරතමුණිගේ ........................................................................................................ පොතේ රසයන් 08 ක් අන්තර්ගතය.

(27) කේරළ කලා මණ්ඩලය මහා කවි ........................................................................... විසින් ආරම්භ කරන ලදී.

(28) බටහිර නර්තනයේ දී .......................................................................................... ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වේ.

(29) ආංගික අභිනයේ දී සිරුර ................................................................................ ලෙස කොටස් 03 කට බෙදේ.

(30) අවකාශය ප්‍රධාන වශයෙන් තල ............................................................................................ කට බෙදේ.

- **පහත ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

- නර්තනය පිළිබඳව තොරතුරු ලබා ගත හැකි අනුරාධපුර යුගයට අයත් සෙල්ලිපි දෙක නම් කරන්න.

(31) ............................................................................ (32) ............................................................................

- නර්තන කලාවේ නීතිරීති මූල ධර්ම ඇතුලත් පහත ග්‍රන්ථ රචනා කළ කතීන් නම් කරන්න.

(33) නාට්‍ය ශාස්ත්‍රය ................................................................................................................................

(34) අභිනය දර්පනය ................................................................................................................................

- පහත මුද්‍රා නාට්‍ය නිෂ්පාදනය කළ ශිල්පීන් කවුද?

(35) චණ්ඩාලිකා ..............................

(36) පරෙවිය ..............................

- පහත රස නිෂ්පත්තිය සඳහා කවර භාවයක් මූලික වේ ද?

(37) වීර ..............................

(38) කරුණා ..............................

- පහත සඳහන් අවනද්ධ භාණ්ඩ යොදාගන්නේ කුමන නර්තන සම්ප්‍රදායට ද?

(39) චෙන්ඩා ..............................

(40) තබ්ලා ..............................

(ලකුණු 40)

## II කොටස

- **ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

01. මංගලම් හි බෙරපදය, කවි පද දෙකක් හා කස්තිරම ප්‍රස්ථාර කරන්න. (ලකුණු 12)

02. රංග වින්‍යාසය පිළිබඳව හැඳින්වීමක යෙදෙන්න. (ලකුණු 12)

03. දේශීය නර්තන සම්ප්‍රදායක් හා බැඳි තාල ලක්ෂණ පිළිබඳව හැඳින්වීමක් කරන්න. (ලකුණු 12)

04. නර්තන කලාවේ පෝෂණයට සංගීත කලාවෙන් ලැබෙන පිටිවහල උදාහරණ සහිත ව දක්වන්න. (ලකුණු 12)

05. භරත නර්තන සම්ප්‍රදායේ,

    සංගීත සම්ප්‍රදාය

    වස්ත්‍රාභරණ

    නර්තන අංග

    ප්‍රභවය හා විකාශය යන ශීර්ෂ ඔස්සේ කරුණු ගොනු කරන්න. (ලකුණු 12)

06. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ එන සංස්කෘතික වටිනාකම විග්‍රහ කරන්න. (ලකුණු 12)